චක්‍රලේඛ අංක 07/2025

WPCEC/MA01/චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව(බ.ප)
අංක 628,
ජනජය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල, නාවල පාර, රාජගිය.
2025.08. 26

බස්නාහිර පළාතේ
සියලුම වි.සේ.ස සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති,සභාපතිවරුන් වෙත.

**<u>සමූපකාර සේවකයින් සම්බන්ධයෙන් කොමිෂන් සභාව මඟින් ලබා දෙන නියෝග ක්‍රියාත්මක කිරීම</u>**

සමූපකාර සේවකයින් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී පිළිපැදිය යුතු නියමයන් පිළිබඳව කොමිෂන් සභාව මඟින් කාර්ය පරිපාටික රීති හා වරින්වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ සහ වෙනත් ලිපි මඟින් කරනු ලබන දැනුම් දීම් කෙරෙහි සමූපකාර සමිති විසින් සුභවාදී ප්‍රතිචාර ලබා නොදෙන බව නිරීක්ෂණය වී ඇති බැවින් පහත කරුණු පිළිබඳව සමිති විසින් දැඩි අවධානයකින් යුතුව කටයුතු කල යුතු බව අවධාරණය කරමි.

i. සමූපකාර සේවක කාර්ය පරිපාටික රීති 1.9 මඟින් සමිති වල පුරප්පාඩු, විධිමත් පරිදි පිරවීමට යම් කාලයක් ගත වන අවස්ථාවන්හීදී කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය මත ස්ථිර සේවකයකු වැඩබැලීම සඳහා පත්කිරීමේ අවස්ථාව ලබා දී ඇත.එසේම 5/2020 හා 5/2020 (1) චක්‍රලේඛ මගින් එකී නියමිත වැඩබැලීමේ කාලසීමාවෙන් ඔබ්බට සමූපකාර සේවකයින් රාජකාරි ඉටුකිරීමේ පදනමින් පත්කල යුතු වන බවද සඳහන් වේ.ඒ අනුව කොමිෂන් සභාවේ අනුමැතිය මත ලබා දෙනු ලබන වැඩබැලීමේ හා රාජකාරි ඉටුකිරීමේ පත්කිරීම් සඳහා පමණක් දීමනා ගෙවීමේ හැකියාව පවතින අතර, කොමිෂන් සභාවේ අනුමැතිය රහිත වැඩබැලීම් හා රාජකාරි ඉටුකිරීම් සඳහා මෙන්ම තාවකාලිකව රාජකාරි ආවරණය කිරීම් සඳහා දීමනා ගෙවා තිබේ නම් එම වටිනාකම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් අයිභාර කිරීමට තීරණය කර ඇත.

ii. සමූපකාර සේවක තනතුරු පුරප්පාඩු ස්ථිර වශයෙන් පුරවාලීම සඳහා නොපමාව කටයුතු කල යුතු වන අතර, එසේ නොහැකි වන අවස්ථා වලදී පමණක් තාවකාලික හා අනියම් පදනමින් සේවකයින් පත් කර ගැනීමේ හැකියාව සමිති වලට ලබා දී ඇත.එම පදනම් යටතේ බඳවා ගත් සමූපකාර සේවකයන් සම්බන්ධයෙන් කටයුතු කල යුතු ආකාරය කොමිෂන් සභා චක්‍රලේඛ 03/2025 මඟින් දැනුම් දී ඇත.එම චක්‍රලේඛය මඟින් ලබා දී ඇති නියෝග ප්‍රකාරව සමූපකාර සමිති වල සේවය කරනු ලබන ස්ථිර නොකරන ලද සේවකයින් නියමිත කාලය අවසානයේදී සේවය අවසන් කිරීම හෝ අත්‍යාවශ්‍ය අවස්ථා වලදි පමණක් සේවා බණ්ඩනයකට ලක්කර සේවයේ තබා ගැනීම කල යුතු අතර එසේ කිරීමේදී සේවා බණ්ඩනයට ලක් කිරීමෙන් වැළකී සිටීම පිළිබඳව නිරීක්ෂණය වී ඇත. අභ්‍යන්තර වැඩපිළිවෙලක් යෙදීම මඟින් සේවය අවසන් නොකල සේවකයින් නියමිත කාලයේදී සේවා බණ්ඩනයකට ලක් කිරීම අනිවාර්යය වන අතර, එසේ නොකරන සමිති සම්බන්ධයෙන් ඉහත චක්‍රලේඛයේ 03 වැනි ඡේදය අනුව කටයුතු කෙරෙනු ඇත.

iii. සමූපකාර සමිති වල විවිධ තනතුරු සඳහා කොන්ත්‍රාත් පත්වීම් ලබා දීමේදී සේව්‍යයා සහ සේවකයා අතර කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීම අනිවාර්යය වන අතර, කොන්ත්‍රාත් පත්වීම් අනුමැතිය සඳහා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන විට අදාළ කොන්ත්‍රාත් ගිවිසුමේ පිටපතක් ද ගිවිසුම්ගත වීම තහවුරු කර ගැනීම සඳහා අමුණා එවිය යුතුය. කොන්ත්‍රාත් සේවකයකු සඳහා සේවා දිගු ලබා දීමක් සිදු නොකරන අතර අදාළ කොන්ත්‍රාත් ගිවිසුම අලුත් කර නියමිත කාලසීමාවක් සඳහා නැවත කොන්ත්‍රාත් පත්වීම ලබා දීම අනුමත කිරීමක් පමණක් සිදු කෙරේ. ගිවිසුමේ සඳහන් කොන්දේසි වල සියලු වගකීම් අදාල දෙපාර්ශ්වය සතු වේ.කොමිෂන් සභා චක්‍රෙල්ඛ 06/2024 හි සඳහන් වන කොන්ත්‍රාත් පත්කිරීම් සම්බන්ධව පනවා ඇති විධිවිධානයන් එලෙසින්ම ක්‍රියාත්මකය

කොමිෂන් සභා නියමය පරිදි

එස්.ජේ. ජයසිංහ,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :1. ලේකම්, පළාත් මාර්ග , ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප) - කා.දැ.ගැ.පි
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප) - කා.දැ.ගැ.පි